පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

ආයතනයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කළුතර

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 492

நிறுவனத்தின் பெயர் - மாவட்ட செயலகம் களுத்துறை

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக, நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No : 492

Name of the Institution : District Secretariat Kalutara

Submission of observation of Hon Minister and steps taken with regard on the reports tabled by the Committee on Public Accounts ins of Standing Order No 119(4).

පාර්ලිමේන්තු කතා මාලා අංක - 492
ආයතනයේ නම - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර

| වාර්තා මගින් ලබාගත් අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කිරීමට ආයතන විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග |
|---|---|
| 1 කොටස | |
| 81.00 | |
| 1) අලාභ ලේඛනය යාවත් කාලීන පදනමක් මත පවත්වාගෙන ගොස් නොමැත. | 2024 වර්ෂයේ සිට අලාභ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යයි. |
| 2) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොමැත. | 2025 වර්ෂය සඳහා සකස් කර ඇත. |
| 3) විගණකාධිපතිවරයා විසින් මාසයක් ඇතුළත මතුකරන ලද සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලැබී නොමැත. | 80% පමණ මසක් තුල පිළිතුරු දී ඇත. ඉතිරි ඒවා ප්‍රා.ලේ.කා. මගින් තොරතුරු ගෙන්වා ගෙන ඉදිරිපත් කළ යුතුය. |
| 4) අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මාසයක කාලයක් තුළ පිළිතුරු ලබාදී නොමැති අවස්ථා තිබේ. | 2024 වර්ෂයේ සිට මේ දක්වා මසක් ඇතුලත පිළිතුරු ලබා දිමට කටයුතු කර ඇත. |
| 5) වාහන සමූහයේ දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණකාධිපතිවරයා සඳහා නිතිපතා ඉදිරිපත් කර නොමැත. | වර්තමානය වන විට ධාවන සටහන් මාසිකව ඉදිරිපත් කර ඇත. |
| 6) සියලුම සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොමැත. | 2025 වන විට රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත. |
| 7) මූල්‍ය රෙගුරාසි වලට අනුව රජය සතු මෝටර් රථවලට සිදුවූ අනතුරු සම්බන්ධයෙන් පියවර ගෙන නොමැත. | පියවර ගෙන ඇත. |
| 8) බැංකු සැසඳුම් ප්‍රකාශනවල සොයා ගැනීම් මගින් හෙළිදරව් කරන ලද සහ සකස් කළ යුතු ශේෂයන්, මූල්‍ය රෙගුලාසි වලට අනුව මාසයක කාලයක් තුළ සකස්කර නොතිබුණි. | 2024 වර්ෂය සිට මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාවට නංවා ඇත. |
| 9) මූල්‍ය නියාමනයට අනුව කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් පියවර ගෙන නොමැත. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ පවතින තැන්පතුව හැර ඉතිරි කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් පියවර ගෙන ඇත. |
| | |
| 571 | |
| FR 94(1) අනුව වෙන් කරන ලද ප්‍රතිපාදන භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, වගකීම් වසර අවසානයේ ඉතිරිව ඇති ප්‍රතිපාදන ඉක්මවා ගියේය. | 2024 / 2025 වර්ෂවල ප්‍රතිපාදන සීමාව තුල වියදම් කළමණාකරනය කර ගෙන ඇත. |
| | |

| | |
|---|---|
| 2 කොටස | |
| 77 | |
| 1) දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම මාසිකව පවත්වා නොතිබුණි. | වර්තමානය වන විට චක්‍ර ලේඛ වලට අනුව කාර්තුවකට වරක් පවත්වයි. |
| 2)1946 අංක 32 දරණ වාරිමාර්ග ආඥා පනතට අනුව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම් මාසිකව පවත්වා නොතිබුණි | වර්තමානයේ දි පවත්වා ඇත. |
| 3) දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව කැඳවා නොතිබුණි. | 2024 වර්ෂයේ වසරකට වාර 3ක් පවත්වා ඇත. |
| 4) දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව කැඳවා නොතිබුණි. | වර්තමානයේ දි මාසිකව පවත්වා ඇත. |
| 5) දිස්ත්‍රික් මිල නියාමන කමිටු රැස්වීම මාසිකව පවත්වා නොතිබුණි. | වර්ෂයකට වාර 2ක් පවත්වා ඇත. |
| 6) සමස්ත කාර්ය මණ්ඩලය ආවරණය වන පරිදි කාර්ය සාධන ගිවිසුම් කෙටුම්පත් කර හෝ ඇතුළත් කර නොතිබුණි. | 02/2018 චක්‍රලේඛ පරිදි වාර්ෂික කාර්ය සාධන ගිවිසුම සිදුකළ යුතු වුවද 02/2018 (1) චක්‍රලේඛ මගින් එය තවදුරටත් සිදු කිරිම අවශ්‍ය නොවන බව දන්වා ඇත. |
| 7) ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය සුදුසුකම් ලත් මතයක්/ ප්‍රතික්ෂේප කළ මතයක්/ අහිතකර මතයක් විය. | 2024 වර්ෂයේ දි තත්වා ගණන කළ මතයක් ලබා දි ඇත. 2025 වර්ෂ සඳහා මෙතෙක් මතය ලබා දි නැත. |
| 8) කාර්ය සාදන අරමුණු නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි. | කාර්යසාදන වාර්තා ඉදිරි පත් කර ඇත. |
| 9) දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුව සෑම කාර්තුවකටම වරක් පවත්වා නොතිබුණි. | වර්තමානයේ දි පවත්වා ඇත. |
| 10) දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු රැස්වීම් සෑම කාන්තුවකටම අවම වශයෙන් එක් වරක්වත් පවත්වා නොතිබුණි. | 2024 වර්ෂයේ සිට පවත්වා ගෙන යයි. |
| 11) සැලසුම්කර තිබූ පුහුණු අවස්ථාවලින් ලබා දී ඇති පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු විය. | 2025 වර්ෂය සඳහා සැලසුම් කර තිබු පුහුණු අවස්ථා සියල්ල නිම කර ඇත. |
| 12) විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | ක්‍රියාත්මක කර ඇත. |
| 13) සියලුම රාජ්‍ය නිලධාරීන් වත්කම් සහ වගකීම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | වර්තමානය වනවිට වත්කම් සහ වගකීම් ලබා දිය යුතු සියළු නිළධාරින් එම වාර්තා ඉදිරිපත් කර ඇත. |
| 14) දිස්ත්‍රික් පාරිසරික කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක්වත් කැඳවා නොතිබුණි. | අවශ්‍යතාවය අනුව පරිසර කමිටුව රැස් වෙයි. 2026 සිට මාසයකට වරක් කමිටුව රැස්විමට සැලසුම් කර ඇත. |

එම්.එල්.එල්.එස්.රණවීර,
ප්‍රධාන ගණකාධිකාරී,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කළුතර .

එච්. එම්. එස්. පි. හේරත්
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්,
කළුතර පරිපාලන දිස්ත්‍රික්කය.

එම්.එල්.එල්.එස්. රණවීර
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

එච්.එම්.එස්.පී.හේරත්
දිස්ත්‍රික් ලේකම් /දිසාපති
කළුතර පරිපාලන දිස්ත්‍රික්කය

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2026 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළගා කර ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය